රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 01/97

මගේ අංකය; ආ/111/2/1-7,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1997 ජනවාරි මස 3 වැනිදින.

සියලුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්.

**<u>රාමසාන් සමයේදී විශේෂ නිවාඩු ලබාදීම</u>**

1996 ජනවාරි මස 18 වැනි දින අංක: 02/96 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමුකරවමි.

02. 1997 වර්ෂයේ රාම්ලාන් (රාමසාන්) උත්සව සමයේදී මුස්ලිම් භක්තිය රාජ්‍ය නිලධාරීන්ට/සේවකයින්ට යාඥා සහ ආගමික වතාවත්වල නිරතවිය හැකිවන පරිදි වැඩ පිළිවෙලක් සකස්කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

03. ආගමික සහ යාඥා කටයුතු දිනපතා සිදුකෙරෙන කාලවේලාවන් පහත දක්වෙන පරිදි වේ.

පෙරවරු 3.30 සිට පෙරවරු 6.00 දක්වා
පෙරවරු 6.30 සිට පෙරවරු 7.30 දක්වා
පස්වරු 6.30 සිට පස්වරු 7.30 දක්වා
පස්වරු 8.30 සිට රාත්‍රී 10.30 දක්වා

04. මෙම කාල සීමාවන් තුලදී ආගමික වතාවත්වල යෙදීමට හැකිවන පරිදි සැමවිටම වැඩමුර සකස්කර දිය යුතුය. එහෙත් අත්‍යාවශ්‍ය අවස්ථාවලදී විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

05. තවද 1997 රාම්ලාන් (රාමසාන්) අවසන්වීමේ දිනට දින 14 කට කලින් රාජ්‍ය සේවයේත්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලත් සුදුසුකම් ඇති මුස්ලිම් නිලධාරීන්ට/සේවකයින්ට උත්සව අත්තිකාරම් මුදල් ලබාදීමට ද කටයුතු කිරීම මැනවි.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.